# ශ්‍රී ලංකාවේ දේශගුණික විපර්යාස සඳහා අනුවර්තිත හැකියාව ගොඩනැංවීම: බහුවිධ ක්‍රියාකරුවන්ගේ අභියෝගය[1]

අමිල බාලසූරිය
පර්යේෂණ වෘත්තික
දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (CEPA)

හරිතාගාර වායු විමෝචනය කරන දිගින් දිගටම සිදුවන මානව ක්‍රියාකාරකම් හේතුවෙන් ගෝලීය දේශගුණය වෙනස්වෙමින් පවතින බව නොරහසකි. මෙහිදී ඉහළ ජනගහනයක් පවතින හා ආර්ථික තත්ත්වයෙන් පහළ මට්ටමේ පවතින සංවර්ධනය වෙමින් පවතින රටවල් දේශගුණ විපර්යාසයන්හි බලපෑම් වලට ලක්වීමේ වැඩි අවදානමක් පවතී. විශේෂයෙන් මෙම රටවල් තුළ ද දිළිඳු ජනතාවට එම බලපෑම් වලට මුහුණ දීම සඳහා වත්කම් සහ සම්පත් සඳහා ඇති අවම හිමිකම නිසා දේශගුණික විපර්යාස කෙරෙහි පවතින අවදානම ඉතා වැඩිය. එමෙන්ම සංවර්ධනය වෙමින් පවතින කුඩා දූපත් රාජ්‍යයන් බාහිර පීඩාවන්, හුදකලාවීම සහ සම්පත් සීමිත වීම යන ආකාරයට දේශගුණ විපර්යාසවලට ග්‍රාහී වෙයි. මුහුදු මට්ටම ඉහළ යෑම, වෙරළ ඛාදනය සහ ජල ගැලීම් වැනි ස්වාභාවික ආපදාවයන්ගේ බලපෑම් නිසා අහිතකර ප්‍රතිවිපාක ඇතිවිය හැකිය. මක්නිසාද ඒවා ජීවිත, ජීවනෝපායන් සහ රටේ සමස්ත සමාජ-ආර්ථික සංවර්ධනය කෙරෙහි බලපෑම් ඇතිකළ හැකි සංසිද්ධීන් වන බැවිනි.

ශ්‍රී ලංකාවේ ජල සම්පත, කෘෂිකර්මාන්තය සහ සෞඛ්‍යය යන අංශවලට දේශගුණ විපර්යාසවලින් සාපේක්ෂව සැලකිය යුතු බලපෑම් ඇති කළ හැකි අතර, භූගෝලීයව වෙරලාශ්‍රිත තීරුව එම බලපෑම්වලට වැඩි වශයෙන්ම ලක්වන ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන ඇත. 25%ක ජනගහනයක් වෙරළබඩ කලාපයේ ජීවත්වන දිවයිනක් වශයෙන්, ශ්‍රී ලංකාවේ වෙරළාශ්‍රිත නාගරික සහ ග්‍රාමීය ප්‍රජාවන් මුහුදු මට්ටම ඉහළයාම, උෂ්ණත්වය ඉහළයාම, ජල ගැලීම්, නියඟ වැනි ආපදා තත්ත්වයන් සහ මුහුදු ජලය ගොඩබිම ජල මාර්ග වෙත ගලා ඒම යන ගැටළුවල බලපෑම් නිසා තර්ජනයට ලක්ව ඇත.

මෙම බලපෑම්වලට ඵලදායී ලෙස අනුවර්තනය වීම සඳහා රටක, සමාජයක, ප්‍රජාවක හෝ පුද්ගලයෙකු සතුව ඇති අනුවර්තිත හැකියාව ඉතා වැදගත්වේ. අනුවර්තිත හැකියාව ගොඩ නැංවීම ආර්ථික, සමාජීය, සංස්කෘතික, දේශපාලනික සහ පරිසර උප අංශයන් යන සියල්ල හරහා සිදු වන අතර, එය විවිධාකාර වූ ක්‍රියාකාරීන්ගෙන් එනම් පුද්ගලයින්, ආයතන, සමාජ සංවිධාන, මහජන ඒකක, රාජ්‍ය හා ජාත්‍යන්තර ආයතන ආදීන්ගේ අන්තර් ක්‍රියාකාරීත්වයන්ගෙන් සැදුම්ලද්දක් වේ. ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ සිට බිම් මට්ටම දක්වා විවිධ ක්‍රියාකාරීන් අතර පවතින තිරස් සහ සිරස් අන්තර් ක්‍රියාවන් මීට ඇතුළත් වේ. මෙහිදී ප්‍රධාන වශයෙන්ම ක්‍රියාකාරීන් මට්ටම් හතරකින් හඳුනාගත හැකිය.

1. ජාතික ප්‍රතිපත්ති සම්පාදන මට්ටම
2. ආංශික ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීමේ මට්ටම (ප්‍රධාන වශයෙන්ම රජයේ දෙපාර්තමේන්තු)
3. සිවිල් සමාජ මට්ටම
4. බිම් මට්ටම (ප්‍රජාව). ශ්‍රී ලංකාව තුළ එම එක් එක් මට්ටම් ක්‍රියාත්මක වන ආකාරය මින් ඉදිරියට විස්තර කර ඇත.

[1] දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (CEPA) විසින් සිදු කළ "Exploratory study on adapting to climate change in coastal areas of Sri Lanka" නමැති පර්යේෂණයේ තොරතුරු පදනම් කරගෙන මෙම ලිපිය සකස්කර ඇත.

## ජාතික ප්‍රතිපත්ති සම්පාදන මට්ටම

ප්‍රතිපත්ති හරහා දේශගුණික විපර්යාස සම්බන්ධ ගැටළු නිරාකරණය කිරීමේ සංකල්පය සාපේක්ෂව තරමක් අලුත් කරුණක් වුවත් ඒ සඳහා රජයේ අනුග්‍රහය ලැබී ඇති අතරම, රජය විසින් ප්‍රතිපත්ති මට්ටමෙන් ආරම්භ කළ යම් යම් මුලපිරීම් මේ වනවිට සැලකිය යුතු ප්‍රගතියක් අත්පත්කරගෙන ඇත. "මහින්ද චින්තනය" දස අවුරුදු සැලැස්ම යටතේ තිරසාර සංවර්ධනයේ අවශ්‍යතාවය හඳුනාගෙන ඇත. මේවාට අදාළ ක්‍රියාත්මක කිරීම් පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් හා විවිධ අංශවලට අදාළ අමාත්‍යාංශ වල සහභාගීත්වයෙන් සිදුවේ. මෙය තොරතුරු හුවමාරුවට සහ විවිධ අදහස් එකිනෙක මුසුවීමට ඉහළ ප්‍රතිපත්ති මට්ටමේ වේදිකාවක් නිර්මාණය කොට දී ඇත. එසේ වුවත් ඔවුන් විසින් ක්‍රියාත්මක කළයුතු ක්‍රියාකාරකම් අනිවාර්ය වී නැත.

ශ්‍රී ලංකාවේ දේශගුණික විපර්යාස සම්බන්ධ ප්‍රතිපත්තිය මේ වන විට පරිසර අමාත්‍යාංශයේ අනුදැනුම මත සම්පාදනය වී ඇත. එහි දේශගුණික විපර්යාසවලට මුහුණ දීම, හරිතාගාර වායු විමෝචනය අවම කිරීම, මෙන්ම පිරිසිදු සංවර්ධන යාන්ත්‍රණය ද අන්තර්ගත වේ. මෙසේ ජාතික ප්‍රතිපත්තිය සම්පාදනය වන අතරතුර 2011 සිට 2016 කාලය දක්වා ශ්‍රී ලංකාවේ දේශගුණික විපර්යාස සඳහා අනුවර්තනය වීමේ ජාතික ක්‍රමෝපාය (Adaptation Strategy) එළි දක්වා ඇති අතර හරිතාගාර වායු විමෝචනය අවම කිරීමේ ජාතික ක්‍රමෝපාය (Mitigation Strategy) ද මේ වනවිට සම්පාදනය වෙමින් පවතී. ශ්‍රී ලංකාවේ දේශගුණික විපර්යාසවලට අදාළව ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය සඳහා විවිධ ක්ෂේත්‍ර, විවිධ මට්ටම් වල පාර්ශවකරුවන්ගේ අදහස් විමසීමේ ප්‍රවේශයක් හරහා සිදුවිය. මෙය විවිධ අංශවල ප්‍රතිපත්තිවලට ද දේශගුණික විපර්යාස අනුකූලනය කරගැනීමට යම් බලපෑමක් සිදුකළ අතරම රජයේ ප්‍රතිපත්ති සම්පාදන සහ තීන්දු තීරණ ගන්නා මට්ටම් තුළ මහත් අවබෝධයක් නිර්මාණය කිරීමට හේතු වී ඇත. එමෙන්ම එය දේශගුණික විපර්යාස සහ ඒවාට අනුගතවීම සම්බන්ධයෙන් ශාස්ත්‍රීය විද්වතුන් අතර ගොනුවී පැවති දැනුම අනෙකුත් පාර්ශවයන්ට ද ගලා යාමට පිටිවහලක් වී ඇත.



ශ්‍රී ලංකාවේ පවතින ආයතනික ව්‍යුහය සහ පරිපාලන පද්ධතිය දේශගුණික විපර්යාසවලට අනුගතවීම පිළිබඳ දැනුම සහ උපාය මාර්ග බිම් මට්ටමට ගෙන යාමට ඵලදායී ලෙස යොදා ගත හැකිය. කෙසේවෙතත් පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය සමස්ත ප්‍රතිපත්ති සම්පාදනය සඳහා වගකිවයුතු ආයතනය වුවත්, ප්‍රතිපත්ති හරහා නිර්දේශ කරනු ලබන විවිධ ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම හා ඊට අදාළ ක්‍රියාකාරකම් බිම් මට්ටම දක්වා රැගෙන යාම අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල පවතින ව්‍යුහයන් හරහා සිදු වීම දැනට පවතින ක්‍රමවේදයයි. ඒ හේතුවෙන් මෙය මූලික වශයෙන්ම පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය හරහා කළමනාකරණය කිරීමට සිදුවන සහභාගීත්ව ක්‍රියාවලියක් බවට පත්වෙයි. මේ සම්බන්ධයෙන් පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය තම කාර්යභාරය පාලනය කිරීම සහ අනුබල දීම ලෙස සැලකුවද, අනෙකුත් අමාත්‍යාංශ හරහා ක්‍රියාත්මක කරනු ලබන කර්තව්‍යයන්ට සහයෝගය දැක්වීම සඳහා ප්‍රමාණවත් මූල්‍යමය හෝ තාක්ෂණික සම්පත් එය සතුව නොපැවතීම ප්‍රධාන අභියෝග යකි. එසේම සම්පාදිත ප්‍රතිපත්ති සහ අනෙකුත් අංශවලට අදාළ පාරිසරික න්‍යාය පත්‍රයන් ක්‍රියාත්මක කිරීම දක්වා රැගෙන යාමට ක්‍රියාත්මක කිරීමේ අංශයක් අමාත්‍යාංශය සතුව නොපැවතීම නිසා එයට අනෙකුත් අමාත්‍යාංශ මත යැපීමට ද සිදුවෙයි.

දේශගුණික විපර්යාස ඔස්සේ පැන නගින්නේ ඒ ආශ්‍රිත සියලු අංශ කෙරෙහි බලපෑම් ඇතිකරන ගැටළු වේ. එබැවින් ඒවාට අනුගතවීම එක් අංශයකට, එක් ආයතනයකට, එක් පාර්ශවකරුවෙකුට, එක්

පුද්ගලයෙකුට කිසිසේත්ම කළ නොහැකිය. නමුත් මේ සම්බන්ධයෙන් විශේෂයෙන්ම අමාත්‍යාංශවලට අදාළව සලකා බැලීමේදී ඔවුන් අතර පවතිනුයේ ඉතාමත් දුර්වල සම්බන්ධීකරණයකි. එය ප්‍රතිපත්ති මට්ටමෙන් දේශගුණික විපර්යාසවලට අනුගතවීමට අදාළව ක්‍රියාත්මක වීමට පවතින විශාල බාධාවකි.

## ආංශික ප්‍රතිපත්ති (Sectoral Policies) සම්පාදන සහ ක්‍රියාත්මක කිරීමේ මට්ටම

දේශගුණික විපර්යාසවලට අනුගතවීමේදී ආංශික මට්ටමට පවතින ප්‍රධානතම ශක්තිය වන්නේ පවතින ආයතනික ව්‍යුහය තුළ අදාළ අංශවලට විශේෂිත පර්යේෂණ සහ ව්‍යාප්ති සේවයයි. විශේෂයෙන්ම කෘෂිකාර්මික සහ ධීවර අංශවල එක් එක් අංශය පාදක කරගත් පර්යේෂණ, තොරතුරු හා දත්ත සහ තාක්ෂණය පාරිසරික ගැටළු මෙන්ම දේශගුණික විපර්යාස හේතුවන් අදාළ අංශවලට ඇතිවන බලපෑම් සාමාන්‍ය ප්‍රවාහයට ඇතුළත්කර ගැනීමට පිටුවහලක් වී ඇත. උදාහරණ ලෙස කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සහ ධීවර අමාත්‍යාංශය යටතේ පවතින පර්යේෂණ ආයතනයන්හි ක්‍රියාත්මක පර්යේෂණයන්හි ප්‍රතිඵල සහ නිර්දේශයන් ඒවායේ පවතින ව්‍යාප්ති සේවය සහ ක්‍රියාත්මක කිරීමේ ආයතන මඟින් බිම් මට්ටම දක්වා රැගෙන යාම දැක්විය හැකිය. මෙය ගොවීන් ට සහ ධීවරයන් ට අවශ්‍ය තොරතුරු සපයමින්, සිදුවන බලපෑම්/වෙනස්කම්වලට අනුව ඔවුන්ගේ කටයුතු වෙනස්කිරීමට හෝ ඒවාට ඵලදායී ලෙස අනුගතවීමට උපකාරී වේ.

ආංශික මට්ටමේ පවතින ප්‍රධානතම බාධකය ලෙස සැලකිය හැක්කේ එක් එක් අංශයන්හි පවතින ඒවාට විශේෂිත වූ ආංශික ප්‍රමුඛතාවයන් ය. එහිදී ආංශික ප්‍රතිපත්ති අනුව යන න්‍යාය පත්‍රයකට ප්‍රමුඛතාවය ලැබෙයි. උදාහරණයක් ලෙස කෘෂිකාර්මික අංශය ප්‍රමුඛතාවය ලබා දී ඇත්තේ ඉහළ අස්වැන්නක් ලබා ගැනීම හරහා ස්වයංපෝෂිතතාවය, ඵලදායීතාව සහ ආහාර සුරක්ෂිතතාවය ළඟාකරගැනීම කෙරෙහිය. මෙම ආංශික ප්‍රමුඛතා දේශගුණික විපර්යාසවලට අනුගතවීම අභිභවා ඉදිරියට පැමිණ ඇති අතර එකී අනුගතවීමට ඇති ඉක්මන් අවශ්‍යතාවයට තවමත් එතරම් සංවේදී වී නැත. එමෙන්ම තොරතුරු හුවමාරු කරගැනීමට සහ එක්ව වැඩකිරීමට විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අනෙකුත් අදාළ ආයතන අතර පවතින දුර්වල සම්බන්ධීකරණය, පවතින දේශගුණික විපර්යාසවලට අනුගතවීමට අදාළ ප්‍රතිපත්ති භාවිතයටත්, බිම් මට්ටමේ ක්‍රියාත්මක කිරීම් වලටත් අවශ්‍ය සහාය මන්දගාමී කිරීමටත් හේතුවී ඇත.

දේශගුණික විපර්යාසවලට අදාළ ගැටළු සහ ඒ සඳහා ක්‍රියාත්මක වන විසඳුම්වලට අදාළව ප්‍රතිපෝෂණයක් පහළ සිට ඉහළට ගමන් කරන ශක්තිමත් ක්‍රමවේදයක් දැකගැනීමට අසීරුය. කෙසේවෙතත් දේශගුණික විපර්යාසයන්හි බලපෑම් එක් එක් ප්‍රදේශවලට විශේෂිත වීම බිම් මට්ටමේ හඳුනාගත් සාර්ථක අනුගතවීමේ ක්‍රම පුළුල්ව ව්‍යාප්ත කිරීමටත්, සාමාත්‍යාංශ කටයුතුවලට එකතුකිරීමටත් හේතුසාධක වී ඇත. තවදුරටත් සැලසුම් ක්‍රියාදාමයේ කෙටිකාලීන දැක්ම සහ රජය හා අමාත්‍යවරුන් වෙනස්වීම් සමඟ වෙනස්වන ප්‍රතිපත්තිවල සහ උපායමාර්ගයන්හි වෙනස්කම් ද දිගුකාලීනව දේශගුණික විපර්යාසවලට අනුගතවීමට අවශ්‍ය සැලසුම් සහ ක්‍රියාකාරකම් යටපත් කර දමයි.

## සිවිල් සමාජ මට්ටම

සිවිල් සමාජ කණ්ඩායම් පිළිබඳව සලකා බැලීමේදී තිරසාර ක්‍රියාකාරකම්වලට ප්‍රමුඛතාවය ලබාදීමේදී ඔවුන් සතුව ඉමහත් නම්‍යතාවයක් පවතී. දේශගුණික විපර්යාසයන්ට අනුගතවීමට අවශ්‍ය විශේෂිත පුහුණුකිරීම්, දැනුවත් කිරීම් ආදියට උපකාර වන තාක්ෂණය සඳහා මෙන්ම යම්තාක් දුරට ප්‍රතිපාදන/මූල්‍යාධාර සඳහා ද ප්‍රවේශයක් ඔවුන් සතුව පවතී. මෙම ක්‍රියාකාරම් ප්‍රතිපත්ති මට්ටමේ සිට බිම් මට්ටම දක්වාම විවිධ පරිමාණයන්ගෙන් ක්‍රියාත්මක වන අතර, එම ප්‍රවාහයේ විවිධ මට්ටම් අතර ප්‍රතිපෝෂණය සපයන

මැදිහත්කරුවෙකු ලෙස ක්‍රියාකරයි. එමෙන්ම ඔවුන් දේශගුණික විපර්යාස සඳහා ග්‍රාහී වන කණ්ඩායම් සමඟ ඍජුවම සම්බන්ධවී ක්‍රියාත්මක වෙමින් පවතින තාක්ෂණික අඩුලුහුඬුකම් පියවීමට ද ක්‍රියාකරනු ලබයි.

කෙසේවෙතත් දේශගුණික විපර්යාසයන්ට අනුගතවීම පිළිබඳව කටයුතු කරන සිවිල් සමාජ කණ්ඩායම් ප්‍රමාණය අතලොස්සක් වන අතරම ඔවුන්ගේ ක්‍රියාත්මකවීම් ද ප්‍රදේශ වශයෙන් මෙන්ම ක්‍රියාකාරකම් වශයෙන් ද විසිරුණු ස්වභාවයක් පෙන්නුම් කරයි. එහෙයින් එම කටයුතු ඉදිරියට ගෙනයාමට හෝ තවත් තැනක ක්‍රියාත්මක කිරීමට මෙන්ම අනෙකුත් ක්‍රියාකාරකම් තුළට ඇඳාගැනීමට හෝ දේශගුණික විපර්යාසයන්ට අනුගතවීමේ ප්‍රධාන වැඩපිළිවෙලට ඇතුළත් කරගැනීමට ප්‍රමාණවත් බලයක් උත්පාදනය නොකරයි. එමෙන්ම තාක්ෂණික දැනුම සහ හැකියාව යන කාරණා සම්බන්ධයෙන් තමන්ට ඇති සීමා ද සිවිල් සමාජ ආයතන සඳහා මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමේදී මුහුණ දීමට සිදුවන අභියෝගයකි.

**බිම් මට්ටම**

වෙනස්වන කාලගුණික තත්ත්ව බිම් මට්ටමේ ක්‍රියාකාරකම්හි නවතාවයන් ඇතිකිරීමටත් ඒවාට අනුගතවීමට නිර්මාණාත්මක ක්‍රමෝපායන් පිළිබඳව අවධානය යොමුකිරීමටත් ප්‍රවේශයක් සපයයි. විශේෂයෙන්ම මෙහිදී එම අනුගතවීම් පිළිබඳව නිර්මාණාත්මකව සිතා බැලීමටත්, අත්හදාබැලීම සඳහාත් එහි අවදානම ගැනීමට බිම් මට්ටමේ නවෝත්පාදකයින් ඉදිරිපත්වෙයි. එමෙන්ම ඔවුන් විසින් එය ක්‍රියාත්මක කර අනෙක් පුද්ගලයන් සඳහා ද ආදර්ශනය කරනු ලබයි. බොහෝවිට මෙම කටයුතු ඌනපූරක මට්ටමෙන් ක්‍රියාත්මක වෙයි. කෙසේවෙතත් මෙහිදී එම ක්‍රියාකාරකම් සඳහා අනුගතවීම කෙරෙහි එහි ඇති ආර්ථික ඵලප්‍රයෝජන ඉතා වැඩි දායකත්වයක් දක්වයි. උදාහරණයක් ලෙස ලවණතාවය හේතුවෙන් ආන්තික භූමි බවට පත්ව ඇති වගා බිම් දේශීය වී ප්‍රභේදවලින් අස්වැද්දීම කෙරෙහි එම ප්‍රභේදයන්හි සහල්වලට ඇති සුවිශේෂිත වෙළඳපල සහ ඉහළ මිල ඉතාමත් වැදගත් සාධක බවට පත්ව ඇත. එමෙන්ම මෙවන් පරිසර හිතකාමී තිරසාර මුලපිරීම්වලට මූල්‍ය, උපදේශනය ආදී වශයෙන් පවතින බාහිර අනුග්‍රහය ද මේ සඳහා රුකුලක් වී ඇත.

මෙහිදී දේශගුණික විපර්යාසවලට අනුගතවීම සඳහා ප්‍රජාව සතුව පවතින සාම්ප්‍රදායික මෙන්ම නූතන දැනුම මෙම ක්‍රියාවලියේදී ධනාත්මක සාධකයක් වූවත්, ඒ සඳහා වැදගත්වන තාක්ෂණික දැනුම සහ දේශගුණික විපර්යාස හා ඊට අනුගතවීමේ ක්‍රමෝපායන්ට අදාළ තොරතුරු සඳහා ප්‍රවේශවීමට ඇති අපහසුතා මේ කෙරෙහි සීමාකාරී සාධක ලෙස බලපානු ලබයි. මීට අමතරව බිම් මට්ටමේ ක්‍රියාත්මකවීම් සඳහා ව්‍යාප්ති සේවාවන්, පහසුකාරීත්වය සැපයීම ආදී පවතින ආයතනික අනුග්‍රහයන් හුදෙක්ම ආර්ථික අරමුණු ඉලක්ක කරගෙන පැවතීම හේතුවෙන් මෙවන් තිරසාර අනුගතවීම් ප්‍රචලිතවීම සීමා කරයි.

**ඉදිරිමග**

දේශගුණික විපර්යාසයන්ට අනුගතවීමේදී විවිධ මට්ටමේ ක්‍රියාකරුවන් අතර පවතින අනුවර්තිත ධාරිතාවය විවිධ වන අතරම ඔවුහු අවධානය යොමු කරන මානයන් ද විවිධ වේ. මේ පිළිබඳව මනා අවබෝධයක් ඇතිකරගනීමත් එකී අනුගතවීම තිරසාරභාවයකින් යුතුව විවිධ මට්ටම් අතර පහළට මෙන්ම ඉහළට ද සංසරණය වීම ඉතා වැදගත් වෙයි. එවන් තත්ත්වයක් තුළ ප්‍රතිපත්ති නිසිලෙස බිම් මට්ටමේ ක්‍රියාත්මක වීමත්, බිම් මට්ටමේ යථාර්ථයන් ප්‍රතිපත්ති වල නිරූපණය වීමත් සිදුවෙයි.


දේශගුණික විපර්යාසයන්හි බලපෑම් ප්‍රදේශවලට සහ විවිධ අංශ වලට විශේෂිත ලෙස බලපාන බැවින් ඒවාට අනුගත වීමේ ක්‍රමෝපායන් සැපයීමේදී ප්‍රාදේශීය වශයෙන් මෙන්ම ආංශික වශයෙන් ද විමධ්‍යගත වූ ප්‍රවේශයක් අනුගමනය කිරීම ඵලදායී විය හැකිය. තවදුරටත් විවිධ මට්ටම් එකී අනුගතවීම් වලට අදාලව

සිදුවන මැදිහත්වීම් සඳහා මූල්‍යය, තොරතුරු, දැනුම, තාක්ෂණය, පර්යේෂණ, ආදී ලෙස අනුබල ලබා දීම ඉහළ අනුවර්තිත හැකියාවක් ගොඩනැංවීමට ඉතා වැදගත් වෙයි.

අනුවර්තිත හැකියාව ගොඩනැංවීම සැලකිය යුතු කාලයක් ගතවන ක්‍රමානුකූල ක්‍රියාදාමයකි. එය විවිධ මට්ටමේ ක්‍රියාකරුවන් අතර අන්තර් ක්‍රියාකාරීත්වය ගොඩනැංවීම, ඔවුන් මේ සම්බන්ධව එකම තලයකට රැගෙන ඒම මෙන්ම අත්හදා බැලීම්, වැරදීම්, පර්යේෂණ ආදිය හරහා දේශගුණික වෙනස්වීම් වල බලපෑම් වලින් නැවත ගොඩනැගීමට අවශ්‍ය පසුබිමක් සැකසීම ආදී ක්‍රියාකාරකම් ඔස්සේ ක්‍රමිකව සිදුවිය යුතු කාර්යපටිපාටියකි.




# තිරසර සංවර්ධනයට පුනර්ජනනීය බලශක්තිය



හම්බන්තොට සූර්ය බලයෙන් විදුලිය නිපදවීම



අඹේවෙල සුළං බලයෙන් විදුලිය නිපදවීමේ ව්‍යාපෘතිය



සූර්ය බල වීථි ලාම්පු



ප්ලැනට් සෝලා නැව

## විදුලි වාහන









**නීලක අබේරත්න**
ඡායාරූප ශිල්පී
පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය